මගේ අංකය : සී.ප්‍රා.ස
/1/5/2018,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.
2018.07.02.

සීතාවක ප්‍රාදේශීය සභාවේ,

ගරු සභාපති/උප සභාපති/ මන්ත්‍රී,

………………………………………………………………………….
මැතිතුමනි / මැතිතුමියනි,

**2018 ජූලි මස මහා සභා රැස්වීම – 04 වන මහා සභාව.**

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 ජූලි මාසයට නියමිත 04 වන මහා සභා රැස්වීම 2018.07.10 වන අඟහරුවාදා දින, පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේ දී පැවැත්වේ.

එදිනට ඔබතුමාගේ / ඔබතුමියගේ පැමිණීම ගෞරවයෙන් බලාපොරොත්තු වෙමි.

මෙයට,
ගරු සභාපතිතුමාගේ නියමය පරිදි,

කේ.ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

**න්‍යාය පත්‍රය.**

01. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.

02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම.

04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.

**05.** යථා පරිදි කල් දී ඇති යෝජනා.

<u>**05 – (01)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය සභාවේ **06** වන මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් පුළුල් කරන ලද සභා ශාලාවේ ශබ්ද විකාශන පද්ධතිය නවීකරණය කිරිම වෙනුවෙන් රු. **3,143,301.90** ක මුදල කොළඹ **07**, ලෝරිස් පෙදෙස, නො.**17** හි ඩයිනමයික් ඒවී ටෙක්නොලජීස් පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**05 – (02)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

**2018.06.19** වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සභා ගත කරන ලද රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාවේ සඳහන් පරිදි, **2016** මුදල් වර්ෂයට අදාලව සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය පාලනය හා කාර්යසාධන ක්‍රියාවලිය **95.5 %** සාර්ථක ලෙස මූල්‍ය හා කාර්යසාධන නියමයන්ට අනුගතව කටයුතු කර ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතන අතරින් සීතාවක ප්‍රාදේශීය සභාව ප්‍රථම ස්ථානය ලබා ගැනීමත්, ශ්‍රී ලංකාවේ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතරින් සීතාවක ප්‍රාදේශීය සභාව පස්වන ස්ථානය ලබා ගැනීමත්, **2012, 2013, 2014, 2015, 2016, 2017** යන වර්ෂ වලදී පළාත් පාලන ආයතන කාර්ය සාධන කළමනාකරණ තරගයේදී අඛණ්ඩව හය වතාවක් කොළඹ දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය දිනා ගැනීමත්, **2015** ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී විශේෂ කුසලතා සම්මානයත් දිනා ගැනීමත්, **2014, 2016** වර්ෂ වල ආදායම් අය කර ගැනීමේ ප්‍රශස්ත මෙහෙවරක නිරත වීම වෙනුවෙන් බස්නාහිර පළාතේ තෙවන ස්ථානයට හිමි සම්මානයත්, සාර්ථක මූල්‍ය කළමනාකරණය විදහා දක්වනු ලබන අවසාන ගිණුම සඳහා **2011,2012,2013,2014,2015,2016** යන වර්ෂ **06** තුළ අඛණ්ඩව යහපත් මතයක් ලබා ගැනීමට දක්වන ලද කැප කිරිම වෙනුවෙන් ලබා ගත් සම්මානයත්, **2017** බස්නාහිර පළාතේ පොදු සේවාවන් මහජනතාවට වඩාත් සුහුරු ආකාරයෙන් ලබා දීම වෙනුවෙන් සිදු කර ඇති සේවාව අගය කරමින් ලබා ගත් සම්මානයත්, බල ප්‍රදේශය තුළ මහජනතාවගේ සෞඛ්‍ය හා රෝග නිවාරණය සඳහා හෙළ වෙදකම සමාජගත කරමින් **2016** වසර තුළ සිදු කරන ලද ප්‍රශස්ථ සේවාව අගයමින් කොළඹ දිස්ත්‍රික් තෙවන ස්ථානයත්, පළාත් පාලන ආයතන අතර **2017** වර්ෂයේදී පවත්වන ලද කසල කළමනාකරණය පිළිබඳ තරගාවලියේ බස්නාහිර පළාතේ පිවිතුරුම ප්‍රාදේශීය සභාවට හිමි මිහිසරු සම්මානයත්, බස්නාහිර පළාත තුළ ටොන් **05** ට අඩු කොම්පෝස්ට් අංගන අතුරින් දෙවන ස්ථානයට හිමි මිහිසරු සම්මානය ලබා ගැනීමත්, ජාතික කියවීමේ මාසය නිමිති කරගෙන පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලය මගින් **2015,2016,** හා **2017** වර්ෂ වලදී පළාත් පාලන ආයතන වන පුස්තකාල අතර තරගාවලියෙන් අඛණ්ඩව කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානයට හිමි සම්මානය ලබා ගැනීමත් තුළින් "සීතාවක ප්‍රාදේශීය සභාව යන නාමය" කොළඹ දිස්ත්‍රික්කය තුළ, බස්නාහිර පළාත තුළ හා ශ්‍රීලංකාව තුළ ඔසවා තැබීමට දක්වන ලද කැප කිරිම අගය කිරිම වෙනුවෙන් සීතාවක ප්‍රාදේශීය සභාවේ සමස්ත කාර්යමණ්ඩලය වෙත අතිරේක වැටුප් වර්ධක දෙකක් ලබා දීමටත්,

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වන ලද පළාත් පාලන ආයතන වල සේවය කරනු ලබන කාර්ය මණ්ඩල සුහදතාවය වර්ධනය කිරිමේ ක්‍රීඩා තරගාවලියේ **2016, 2017** හා **2018** යන වර්ෂ වලදී අඛණ්ඩව අති විශිෂ්ට අන්දමින් කොළඹ දිස්ත්‍රික් ශූරතාවය හා බස්නාහිර පළාත් ශූරතාවය සීතාවක ප්‍රාදේශීය සභාවට දිනා දීමට කැප වී ක්‍රීඩා කල සියළුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දිරිගැන්වීමක් ලෙස ඔවුනට පහත සඳහන් පරිදි

**එක්වරක් පමණක් ලබා දෙන දිරිගැන්වීමේ දීමනාවක් සහා අරමුදලින් ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**<u>කොළඹ දිස්ත්‍රික් - වොලිබෝල් අනුශූරතාවය ලබා ගත් කණ්ඩායම.</u>**

**01.** ජගත් පුෂ්පකුමාර මයා
**02.** නිශාන්ත ජයලත් මයා
**03.** පී.ඩී. ඩිලාන් චතුරංග මයා
**04.** ඩී. රෝහණ මයා
**05.** දිල්හාන් මනුරංග මයා
**06.** බී.ඩී. සේනාරත්න මයා
**07.** එල් .මදුසංක මයා
**08.** බී. අරුණ කුමාර සරත්චන්ද්‍ර මයා
**09.** එම්. දුමින්ද ප්‍රදීප් මයා
**10.** වයි.එච්. ප්‍රදිප් මයා

රු.**10,000.00**

**<u>බස්නාහිර පළාත් - වොලිබෝල් අනුශූරතාවය ලබා ගත් කණ්ඩායම.</u>**

**01.** ජගත් පුෂ්පකුමාර මයා
**02.** නිශාන්ත ජයලත් මයා
**03.** පී.ඩී. ඩිලාන් චතුරංග මයා
**04.** ඩී. රෝහණ මයා
**05.** දිල්හාන් මනුරංග මයා
**06.** බී.ඩී. සේනාරත්න මයා
**07.** එල් .මදුසංක මයා
**08.** බී. අරුණ කුමාර සරත්චන්ද්‍ර මයා
**09.** එම්. දුමින්ද ප්‍රදීප් මයා
**10.** වයි.එච්. ප්‍රදිප් මයා

රු.**20,000.00**

## <u>05 – (03) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

**සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමග ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

| අනු අංක | ව්‍යාපෘතිය | මූල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | මුදල රු. |
|---|---|---|---|---|
| **1.** | වැලිකන්න ජපමාල මාවත පල්ලිය ඉදිරිපිට ආරම්භයේ සිට තාර දමා සංවර්ධනය කිරීම. | සුබිත පුරවර | සභාපති, ළහිරුගම ග්‍රාම සංවර්ධන සමිතිය, 442/ඩී, ළහිරුගම. | **508,111.33** |
| **2.** | ළහිරුගම ප්‍රධාන මාර්ගයේ ක්‍රීඩා පිටියට හැරෙන තුංමං හංදියේ සිට ඉදිරියට තාර දමා සංවර්ධනය කිරීම. | සුබිත පුරවර | සභාපති, ළහිරුගම ග්‍රාම සංවර්ධන සමිතිය. 442/ඩී, ළහිරුගම | **508,406.96** |
| **3.** | අකරවිට ලෙනවර රජමහා විහාරය ආශ්‍රිතව සංචාරකයන් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | පළාත් සංවර්ධන | සභාපති, සමාධි වැඩිහිටි සංවිධානය, අකරවිට,කොස්ගම | **214,515.69** |
| **4.** | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ රජයේ ඉඩමේ පිහිටි කොස්ගම දාතුරුගොඩ ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම. | පළාත් සංවර්ධන ප්‍රදාන (විශේෂ) | සභාපති, අමාජීව වැඩිහිටි සංවිධානය, අංක 427/බී, පහළ කොස්ගම බටහිර. | **249,089.80** |
| **5.** | සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් හංවැල්ල පොදු වැසිකිලිය අළුත්වැඩියා කිරීම. | පළාත් නිශ්චිත | සභාපති, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | **805,000.00** |
| **6.** | සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් අරුක්වත්ත ගනේගොඩ පොදු පාර සංවර්ධනය කිරීම. | පළාත් නිශ්චිත | සභාපති, ගොඩවෙල අමුණ ගොවි සංවිධානය. | **574,331.44** |
| **7.** | සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් නිමල්සිරි මාවත පොදු මාර්ගය සංවර්ධනය කිරීම. | පළාත් නිශ්චිත | සභාපති, පැරකුම් ගොවි සංවිධානය, උඩුමුල්ල. | **1,148,754.09** |
| **8.** | සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් පින්නවල කන්දෙවත්ත පොදු මාර්ගය සංවර්ධනය කිරීම. | පළාත් නිශ්චිත | සභාපති, පින්නවල උතුර ග්‍රාම සංවර්ධන සමිතිය. | **573,911.74** |
| **9.** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ 431/ඒ වේරගොල්ල උතුර ග්‍රා.නි. වසමේ අවිස්සාවේල්ල වත්ත ඉදිරිපිට පොදු මාර්ගය සංවර්ධනය කිරීම. | පළාත් සංවර්ධන | සභාපති, වේරගොල්ල ප්‍රජාසේවා කේන්ද්‍රය. | **343,304.19** |
| **10.** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ පහත්ගම බඳුවත්ත ලූකස්කන්ද පොදු මාර්ගය සංවර්ධනය කිරීම | උපමාන පාදක | සභාපති, පහත්ගම ග්‍රාම සංවර්ධන සමිතිය, 443/ඒ, පහත්ගම. | **344,722.50** |
| **11.** | පාදුක්ක ප්‍රා.ලේ. කොට්ඨාසයේ අංගමුව ජයන්ති මාවත පිට්ටුහේනවත්ත පොදු මාර්ගය සංවර්ධනය කිරීම | උපමාන පාදක | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, 460, අරුක්වත්ත උතුර. | **337,234.27** |
| **12.** | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ නෙළුවත්තුඩුව කොළන්කන්ද පොදු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | පළාත් සංවර්ධන ප්‍රදාන (විශේෂ) | සභාපති, කහහේන සමගි ගොවි සංවිධානය, කහහේන. | **459,076.02** |
| **13.** | නෙළුවත්තුඩුව, දිද්දෙණිය ප්‍රධාන මාර්ගයේ වෙන්දේසි වත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | සුබිත පුරවර | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, කහහේන, වග. | **585,450.23** |

| | | | | |
|---|---|---|---|---|
| 14. | ලබුගම පාරේ සිට කහහේන වටරවුම පාර සංවර්ධනය කිරීම. | සුභිත පුරවර | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, කහහේන, වග. | 586,040.23 |
| 15. | සුදුවැල්ල ආදාහනාගාරයේ චිමිනිය අළුත්වැඩියා කිරීම. | සභා අරමුදල් | එම්.එන්.ජී කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම, 920/2,සියඹලාපේ වත්ත, දෙල්ගොඩ. | 787,750.00 |
| 16. | පාදුක්ක ප්‍රජා ශාලාව ඉදිරිපිට සංවර්ධන කටයුතු සිදු කිරීම. | සභා අරමුදල් | සභාපති, 461/1, පාදුක්ක ගොවි සංවිධානය. | 80,000.00 |
| 17. | හංවැල්ල රාජසිංහ විද්‍යාල මාවත 11 සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති, පහත්ගම ග්‍රාම සංවර්ධන සමිතිය, 443/ඒ, පහත්ගම. | 62,313.71 |
| 18. | හංවැල්ල වැලිකල මාවත 1 වන වංගුව අසල සිට ළදරු පාසල දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීම. | සභා අරමුදල් | සභාපති, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | 456,411.22 |
| 19. | දිද්දෙණිය කම්මල්වත්ත පාර පාලම අසල ජලය රැස්වන කොටස කොන්ක්‍රීට් කිරීම. | සභා අරමුදල් | සභාපති, දිද්දෙණිය දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය. | 433,450.00 |
| 20. | සේනානායක පෙදෙස අතුරු පාර සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති, 461, පාදුක්ක ගොවි සංවිධානය. | 284,684.92 |
| 21. | බ්‍රැන්ඩිගම්පල ප්‍රජා ශාලාව සහ බහුකාර්ය ගොඩනැගිල්ලේ සිවිලිමේ ඉතිරි කොටස සහ ඉතිරි වැඩ නිම කිරීම. | සභා අරමුදල් | සභාපති, බ්‍රැන්ඩිගම්පල වැඩිහිටි සමිතිය, 248, ලබුගම පාර, නිරිපොල, හංවැල්ල. | 109,321.30 |
| 22. | බොල්ලතාව වඩු මඩුව පාර තාර දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති, 433, බොල්ලතාව, ජනජය ග්‍රම සංවර්ධන සමිතිය. | 268,228.99 |

**05 – (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය විසින් යෝජනා කරයි.**

සාලාව අත්කම් නිවාසයේ ප්‍රාදේශීය සභාව සතු නාන ළිදට අපද්‍රව්‍යය බැහැර කිරීම හේතුවෙන් අවට ජනතාව පීඩා විඳින අතර පරිසරයටද හානි සිදුවේ. තවද ඩෙංගු මදුරුවන්ට මෙය කදිම තෝතැන්නක් බවටද අවකාශය සැලසී ඇත. මෙම භූමි භාගයේ මායිම් වෙනස් වී ඇති බවටද පැමිණිලි ලැබී ඇත. මෙම ළිද මීට වසර කීපයකට පෙර ජනතාව පාවිච්චි කරන ලද දිය උල්පතක් වේ. මේ වනවිට කාගේ හෝ උවමනාවක් නිසාදෝ කියා හිතෙන තරමටම මෙම ස්වාභාවික දිය උල්පත සහිත ළිද විනාශ කරමින් පවතී. මෙය මැනුම් කර ජනතාවට භාර දිය යුතුව ඇත. තවද භයානක ඩෙංගු රෝගයේ තිඹිරිගෙය වීම වළක්වා අවට ජනතාවට ඇතිව තිබෙන මරණ භය ඉවත් කළ යුතු වේ.මේ සම්බන්ධව 2016.08.27 වන දින ගරු පළාත් සභා මන්ත්‍රී ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා මගින්ද සීතාවක ප්‍රාදේශීය සභාව දැනුවත් කොට ඇත. දිගින් දිගටම දැනුවත් කර ඇති පිටපත් මා සතුවද ඇත. මා විසින් මෙම පිටපත් සමග ඉල්ලීමක් සහිතව ලිපියක්ද මීට මාස එකහාමාරකට පමණ පෙර ගරු සභාපතිතුමාට ලබා දුනිමි.

ඒ පිළිබදව කිසිම ප්‍රතිචාරයක් නොමැති වීම ගැන කණගාටුවට පත් වෙමි. එබැවින් නැවතත් මෙම ලිපිය මගින් කඩිනමින් මේ පිළිබදව සැලකිලිමත් වී විසදුමක් ලබා දෙන ලෙස මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ධම්මික වීරරත්න මැතිතුමා විසින් යෝජනා කරයි.**

**නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතියේ කටයුතු සඳහා සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් විවිධ ගොඩනැගිලි හා ඉඩම් කලක සිට බදු හා විවිධ පදනම් යටතේ ලබා දී තිබේ. සමුපකාර සමිතියේ මේ වන විට හට ගෙන ඇති තත්වයන් මත ඉදිරියේදී ඇති විය හැකි ගැටළු සීතාවක ප්‍රාදේශීය සභාවටද බලපෑ හැකිය. එබැවින් සමුපකාරයට ලබා දී ඇති ඉඩම් ගොඩනැගිලි වැනි දේපල වල ගිවිසුම් ඒක පාර්ශවීයව අවසන් කර සියලු දේපල ආපසු ලබා ගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**05 – (06) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා විසින් යෝජනා කරයි.**

**සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දැනට පවතින අත්පන්දු ක්‍රීඩාව ක්‍රීඩාවට උචිත ලෙස නවීකරණය කර සංවර්ධනය කිරිමට හා ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, විනිසුරුවන් පුහුණු කිරිම සඳහා විශේෂ වැඩසටහනක් දියත් කිරිම, ප්‍රදේශයේ තෝරාගත් සීමාවල තම අත්පන්දු ක්‍රීඩා පිටි සකස් කර ප්‍රවර්ධන සඳහා ප්‍රවර්ධන කටයුතු කිරිමට වැඩ පිළිවෙලක් සකස් කර දියත් කිරිම සඳහා මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**05 – (07) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**කොස්ගම කොට්ඨාසයේ තාවල්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ මැද තාවල්ගොඩ ගම්වාසීන්ගේ පොදු පහසුකම් සඳහා භූමියක් හෝ ගොඩනැගිල්ලක් නොමැති අතර පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදි කිරිම සඳහා පර්චස් 4 ක භූමි කොටසක් සීතාවක ප්‍රාදේශීය සභාව වෙත ඔප්පුවකින් පවරා දීමට අංක 139, තාවල්ගොඩ, කොස්ගම ලිපිනයේ පදිංචි ඒ.ආර්.එම්. ජයන්ත මහතා කැමැත්ත පල කර ඇත. ඒ බැවින් එම බිම් කොටස මැනුම් කටයුතු කර වෙන්කර ගැනීමට හා ඔප්පුවකින් සීතාවක ප්‍රාදේශීය සභාව වෙත ඔප්පු ගාස්තු සහා අරමුදලින් ගෙවා පවරා ගැනීමෙන් අනතුරුව පොදු පහසුකම් සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරිමට කටයුතු කල යුතු බවට මම මෙම ගරු සභාවට යොජනා කරමි.**

**05 – (08) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**කොස්ගම කොට්ඨාසයේ කනම්පැල්ල බටහිර ග්‍රාම නිලධාරි වසමේ කනම්පැල්ල කොස්ගම ප්‍රධාන මාර්ගයේ කනම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලයේ සිට කනම්පැල්ල දෙසට මාර්ගයේ දකුණු පසට ඇති දෙවෙනි මාර්ගය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කර ඇති අතර ඒ සඳහා නමක් යොදා නොමැත. ඒ සඳහා එම මාර්ගයේ පදිංචිව සිට යුධ සමයේ දී කිලිනොච්චි ඉදිරි ආරක්ෂක වළල්ලේදී රට දැය වෙනුවෙන් දිවි පිදූ රණවිරු අජිත් ඉන්දික කුමාර මහතා නමින් නම් කරන ලෙස එම මාර්ගයේ පදිංචි කරුවන් විසින් ඉල්ලීම කරන බැවින් මෙම මාර්ගය " රණවිරු අජිත් ඉන්දික කුමාර මාවත" ලෙස නම් කළ යුතු බවට මම මෙම ගරු සභාවට යොජනා කරමි.**

**05 – (09) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ලියනගේ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 444/ඒ මාවතගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ හයිලෙවල් පාර අද්දර පිහිටි වන්නිගේ වත්ත ඉඩම මැදින් දිවෙන මාර්ගය මාවතගම ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානයේ විහාරාධිපතිව වැඩ විසූ අපවත් වී වදාල රත්මල්ගොඩ සීලරතන නායක ස්වාමීන් වහන්සේට ගෞරවයක් ලෙස උන් වහන්සේගේ නමින් "රත්මල්ගොඩ සීලරතන නාහිමි මාවත" ලෙස නම් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**06.**කාරක සභා වාර්තා.

**06 – (01 ) 2018.06.25** නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 – (02 ) 2018.06.26** කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 – (03 ) 2018.06.28** පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 - (04) 2018.06.29** මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 - (05) 2018.06.11** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**06 - (06) 2018.06.29** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**07.**ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.

**07 – (01) 2018** මැයි මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.

**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ.